# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 13
# දරන ගම්බද අධිකරණ
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 13 දරන
ගම්බද අධිකරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

ඇල්.ඩී.—ඕ. 34/72.

**ගම්බද අධිකරණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 13 දරන ගම්බද අධිකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. ගම්බද අධිකරණ ආඥාපනතේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **8 වන අධිකාරයේ 40 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.**

" ගම්බද අධිකරණ විසින් අය කර ගනු ලබන දඩ මුදල්, දණ්ඩන ආදිය පිළිබඳ සුදුසු සක් කිරීම.

40. ගම්බද අධිකරණයක් විසින් යම් දඩ මුදල්, දණ්ඩන, රාජ්‍ය සන්තක කිරීම් හෝ වෙනත් මුදල් අය කර ගනු ලැබූ අවස්ථාවක, ඒ අධිකරණයේ අධිකරණ සීමාව තුළ යම් ගම් ප්‍රදේශයක ප්‍රජා අරමුදලට ඒ මුදලින් ගම් සභා ආඥාපනත යටතේ ගෙවිය හැකි කොටස සභාපති විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්, 38 වන සහ 39 වන වගන්ති වල විධිවිධානවලට යටත්ව, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා අනුමත කරන ලද යම් බැංකුවක, එම ප්‍රජා අරමුදලේ බැරට තැන්පත් කළ යුතු ය. තවද යම් ශේෂයක් වේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය. ".

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.